# කැලණිය ප්‍රකාශනය

# (ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය හා සන්නිවේදන අධ්‍යාපනය සහ කර්මාන්තය)

2010 වර්ෂයේ නොවැම්බර් 09 සහ 10 දෙදින කැලණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ දී පවත්වන ලද ජාතික ජනමාධ්‍ය සමුළුව - 2010 ඇසුරෙන් මෙම ප්‍රකාශනය සකස් කරන ලදී. මෙම සමුළුව ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අතුරෙන් ජනමාධ්‍ය හා සන්නිවේදන විෂයක්ෂේත්‍ර හදාරනු ලබන විශ්වවිද්‍යාලවල සහභාගීත්වයෙන් මෙන්ම මාධ්‍ය කර්මාන්තය නියෝජනය වන පරිදි නිරීක්ෂකයන් කිහිපදෙනෙකුගේ සහභාගීත්වයෙන් පවත්වනු ලැබීය.

මෙම සමුළුව කැලණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අධ්‍යයන අංශය විසින් ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව සංවිධානය කරන ලදී.

***සහභාගී වූ පිරිස:***

1. ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
2. ජනමාධ්‍ය ඒකකය, කොළඹ විශ්වවිද්‍යාලය
3. ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය
4. සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
5. සමාජීය අධ්‍යයන අංශය, විවෘත විශ්වවිද්‍යාලය
6. ලලිත කලා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
7. කලා පීඨය, යාපනය විශ්වවිද්‍යාලය
8. භාෂා පීඨය, නැගෙනහිර විශ්වවිද්‍යාලය
9. සමාජීය විද්‍යා පීඨය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
10. සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

***මෙම සමුළුවේ අරමුණු වූයේ,***

- ශ්‍රී ලංකාවේ මාධ්‍ය හා සන්නිවේදන අධ්‍යාපනයේ ස්වභාවය, ගුණාත්මකතාව, අදාලත්වය සහ එහි අනාගතය ඇගයීම.

  සහ

- ජනසන්නිවේදනය පිළිබඳ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ ජාතික සංවිධානයක් පිහිටුවීම.

*මේ යටතේ සැසි කිහිපයක් තුළ විෂය ක්ෂේත්‍රය සාකච්ඡා කරන ලදී.*

1. ශ්‍රී ලංකාවේ මාධ්‍ය අධ්‍යාපනය
2. විෂය ක්ෂේත්‍ර හඳුන්වාදීම; අත්දැකීම් සහ ගැටළු.
3. ශ්‍රී ලාංකීය සන්නිවේදන අධ්‍යාපනය සහ මාධ්‍ය කර්මාන්තය; ගැටළු සහ අභියෝග
4. ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය ප්‍රතිපත්ති
5. ජනසන්නිවේදන විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සංවිධානයක් පිහිටුවීම.

ශ්‍රී ලංකාවේ වර්තමාන ජනමාධ්‍ය ව්‍යුහය, එහි ක්‍රියාකාරීත්වය, ජනමාධ්‍ය කර්මාන්තය, මාධ්‍ය අධ්‍යාපනය යන අංශ සාකච්ඡාවට බඳුන් කරමින් වර්තමානයේ මුහුණ දී ඇති සමාජ, සංස්කෘතික, දේශපාලන වටපිටාව තුළ ඇති මාධ්‍ය ගැටළු විවරණය තුළ පහත සඳහන් යෝජනාවන් මෙම සමුළුවේ දී ඉදිරිපත් කරන ලදී.

***සමුළු යෝජනා මාලාව***

*1. විශ්වවිද්‍යාල සඳහා*

- මාධ්‍ය හා සන්නිවේදන අධ්‍යාපනයේ අන්තර්ගතය සහ ඉලක්කය වඩා පුළුල් එකක් වීම. එය විෂයාන්තර සහ බහුවිෂයික අධ්‍යයන පදනමකින් සකස් කර ගැනීම. ජනමාධ්‍යවේදීන් බිහිකිරීම පමණක් ඉලක්ක නොකර බහුවෘත්තීමය තත්ත්වයක් ඇති කිරීම.
- එක් එක් විශ්වවිද්‍යාලවල ජනසන්නිවේදන විෂය නිර්දේශ සමකාලීනව යාවත්කාලීන කිරීම සහ ඒවා අතර හරස් පැතිකඩ විශ්ලේෂණ (Cross Sectional Analysis) ඔස්සේ ජාතික අවශ්‍යතා හා ජාත්‍යන්තර ප්‍රමිතීන් මත පදනම්ව විෂය නිර්දේශ සකස් කර ගැනීම.
- විශ්වවිද්‍යාල අධ්‍යයන අංශවල සාමූහිකත්වයෙන් ජාතික වශයෙන් මාධ්‍ය හා සන්නිවේදන ශාස්ත්‍රීය සංග්‍රහයක් (Sri Lankan Journal of Media and Communication) සහ ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ශාස්ත්‍රීය සංග්‍රහයක් ප්‍රකාශයට පත් කිරීම. ඒවා වෙබ් අඩවියක ප්‍රකාශයට පත් කිරීම.
- විෂය ක්ෂේත්‍රයේ තාක්ෂණික යෙදුම් හා ක්ෂේත්‍රය පිළිගත් නිරන්තර කථිකාවක් ජාතික වශයෙන් දියත් කිරීම.
- ශ්‍රී ලංකාවේ මාධ්‍ය හා සන්නිවේදන අධ්‍යයන අංශයන්ගේ එකමුතුවෙන් විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ ජාතික සංගමයක් පිහිටුවීම.
- මාධ්‍ය සහ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා විචාර පූර්වක ග්‍රාහක සමාජයක් සකස් කිරීමෙහිලා විද්‍යාර්ථීන් බල ගැන්වීම.
- බහුවිධ අදහස්, නිදහස්, විවෘත සමාජ සංස්කෘතියක් තුළ පිළිගැනීමට අවශ්‍ය කටයුතු සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.
- රාජ්‍ය/පෞද්ගලික මාධ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමේ දී විද්වත් නිර්දේශ ඉදිරිපත් කිරීම.

- ශ්‍රී ලාංකීය සන්නිවේදන පර්යේෂණ සම්ප්‍රදායක් සකස් කිරීම.
- අන්තර් විශ්වවිද්‍යාලයීය මට්ටමින් පර්යේෂණ හා අත්දැකීම් හුවමාරු කරගැනීමේ විධිමත් වැඩපිළිවෙලක් සකස් කිරීම.
- ජාත්‍යන්තර සන්නිවේදන හුවමාරු වැඩසටහන් සහ සාමූහික පර්යේෂණ සඳහා දිරිමත් කිරීම.

*2. මාධ්‍ය කර්මාන්තය සඳහා*

- ජනමාධ්‍ය අධ්‍යයනය හා ජනමාධ්‍ය කර්මාන්තය අතර පවත්නා පරතරය අවම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- විශ්වවිද්‍යාල විද්‍යාර්ථීයාට ජනමාධ්‍ය ආයතනවල ප්‍රායෝගික පුහුණුවීම් සඳහා යම් ප්‍රතිශතාත්මක අගයක් ලබා ගැනීමට කටයුතු කිරීම(Quota).
- ජනමාධ්‍ය ක්‍රියාකාරීත්වයේ දී සමාජ වගකීම (Social Responsibility) පිළිබඳ විමසිලිමත් වීම.
- කර්තෘ මණ්ඩල ස්වාධීනතාව (Editorial Independence) සඳහා අවශ්‍ය පසුබිම ජනමාධ්‍ය ආයතන තුළ ස්ථාපිත කිරීම.
- ජනමාධ්‍යවේදීන්ගේ අධ්‍යාපනික හා පර්යේෂණාත්මක කාර්යන් සඳහා දිරි ගැන්වීම.

*3. රජය සඳහා*

- සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය පිළිබඳව පාසල් විෂය නිර්දේශය නැවත සකස් කිරීම. එහි අන්තර්ගතය පිළිබඳ ගැඹුරින් සලකා බැලීම. එහි ප්‍රමාණය සහ අවශ්‍යතාව විද්‍යාත්මකව හඳුනා ගැනීම.
- මාධ්‍ය සහ සන්නිවේදන විෂය ක්ෂේත්‍රයේ නව පර්යාය වදන් සඳහා සිංහල හා දෙමළ පර්යාය වදන් මාලාවක් (Glossary) සකස් කරගැනීමට අවශ්‍ය කටයුතු සකස් කරගැනීම.
- විශ්වවිද්‍යාල මාධ්‍ය හා සන්නිවේදන අධ්‍යාපනයේ ප්‍රායෝගික අධ්‍යයනය සඳහා ජාතික ප්‍රතිපත්තියක් රාජ්‍ය මට්ටමෙන් සකස් කිරීම.
- ජනසන්නිවේදන උපාධිධාරියා සඳහා ජාතික වශයෙන් පිළිගත් වෘත්තීමය තත්ත්වයක් නෛතික වශයෙන් පිහිටුවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- මාධ්‍ය හා සන්නිවේදනය පිළිබඳ පොදු ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම.
- ජනමාධ්‍ය/සන්නිවේදනය/ජනසන්නිවේදනය අධ්‍යයන කටයුතුවල යෙදෙන විශ්වවිද්‍යාලවලට ගුවන්විදුලි හා රූපවාහිනී බලපත්‍ර ලබා දීම. (Campus Radio/TV)
- මාධ්‍යවේදීන් සඳහා බලපාන මාධ්‍ය නීති, ආචාරධර්ම, කොන්දේසි සහ ඔවුන්ගේ කාර්යභාරයන් පිළිබඳව දැනුවත් කිරීම සඳහා අවශ්‍ය වැඩසටහන් සකස් කිරීම.
- නව මාධ්‍ය පරිසරය සඳහා නියාමන ප්‍රතිපත්තියක් සකස් කිරීම.